# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2311/08 - 2022 දෙසැම්බර් මස 19 වැනි සඳුදා - 2022.12.19

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

**1969 අංක 1 දරන ආනයන හා අපනයන පාලන පනත**

1985 අංක 48 දරන සහ 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4 වන වගන්තියේ (1) වන උපවගන්තිය, සහ 14 වන වගන්තිය සමඟ කියවිය යුතු, 20 වන වගන්තිය යටතේ, මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය රනිල් වික්‍රමසිංහ වන මවිසින් පනවනු ලබන රෙගුලාසි.

**රනිල් වික්‍රමසිංහ,**
මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ
ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය.

2022 දෙසැම්බර් මස 19 වැනි දින,
කොළඹ 01,
මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ දී ය.

**රෙගුලාසි**

**1.** මෙම රෙගුලාසි **"2022 අංක 24 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි"** ලෙස හඳුන්වනු ලැබේ.

**2.** මෙම රෙගුලාසි 2022 දෙසැම්බර් මස 20 වන දින සිට බලාත්මක වේ.


1A - PG 6126 — 376 (2022/12)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

3. සංශෝධිත 2022 අගෝස්තු මස 23 දිනැති අංක 2294/30 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත්කරන ලද 2022 අංක 13 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි, මෙමගින් තවදුරටත් සංශෝධනය කෙරේ.

3.1 ඉහතින් සඳහන් කරන ලද 2022 අංක 13 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි වල I වන උපලේඛනයෙන්, මෙම *ගැසට් පත්‍රයේ* ඇ **උපලේඛනයේ** විස්තර කර ඇති භාණ්ඩ, මෙයින් ඉවත් කරනු ලැබේ.

3.2 2006 අංක 01 දරන රජයේ ආදායම් ආරක්ෂණ (විශේෂ විධිවිධාන) පනත සමඟින් කියවිය යුතු රේගු ආඥාපනතේ විධි විධාන වලට අනුව, මෙම *ගැසට් පත්‍රයේ* **ඇ උපලේඛනයෙහි** නිශ්චිතව දක්වා ඇති සහ 2022 අගෝස්තු මස 24 දින සිට 2022 දෙසැම්බර් මස 19 දින දක්වා කාල සීමාව තුළ ශ්‍රී ලංකාවේ ඕනෑම වරායක් / ගුවන්තොටුපළක් වෙත ළඟාවූ, ඕනෑම භාණ්ඩයක් / භාණ්ඩ තොගයක් නිදහස් කිරීම සඳහා ශ්‍රී ලංකා රේගු අධ්‍යක්ෂ ජනරාල් වෙත මෙයින් බලය පවරනු ලැබේ.

ඇ උපලේඛනය

| | *I තීරුව ශීර්ෂ අංකය* | *II තීරුව සංයෝජිත වර්ගීකරණ සංකේතය* | | *III තීරුව විස්තරය* | *IV තීරුව තාවකාලික- අත්හිටුවීම (TS)* |
|---|---|---|---|---|---|
| **99** | **44.11** | | | දුම්මල හෝ අනෙකුත් කාබනික ද්‍රව්‍යයන් සමඟ එකට ඇල වූ හෝ නොඇලවූ ලීයෙන් හෝ අනෙකුත් ලීග්නීමය ද්‍රව්‍ය වලින් නිම කළ පයිබර් ලෑලි. | |
| | | | - | මධ්‍යම ඝනත්වය ඇති පයිබර් ලෑලි : | |
| | | | -- | ඝනකම මිලි මීටර 5 නොඉක්මවන | |
| | | 4411.12.10 | --- | ඝනත්වය ඝන සෙන්ටි මීටරයට ග්‍රෑම් 0.8 ඉක්මවන, යන්ත්‍රානුසාරයෙන් වැඩ දැමීම හෝ මතුපිට ආවරණය කිරීම නොකළ | **TS** |
| | | | | | |
| **154** | **65.06** | | | පෝරු දැමූ හෝ නොදැමූ හෝ හැඩ ඇල්ලූ හෝ නොඇල්ලූ අනෙකුත් හිස්වැසුම් | |
| | | | - | අනෙකුත්: | |
| | | 6506.91.10 | --- | නාන විට පළඳින කැප් තොප්පි | **TS** |
| | | | | | |
| **309** | **85.25** | | | ග්‍රාහක උපකරණ හෝ ශබ්ද පටිගත කරන හෝ ප්‍රති නිෂපාදනය කරන උපකරණයන් ඒකාබද්ධ කරන හෝ නොකරන ලද, ගුවන් විදුලි ප්‍රචාරය හෝ රූපවාහිනීය සඳහා වූ සම් ප්‍රේෂණ උපකරණ; රූපවාහිනී කැමරා, සංඛිත කැමරා සහ වීඩියෝ කැමරා පටිගතකරණයන්. | |

| | I තීරුව ශීර්ෂ අංකය | IIතීරුව සංයෝජිත වර්ගීකරණ සංකේතය | | III තීරුව විස්තරය | IV තීරුව තාවකාලික- අත්හිටුවීම (TS) |
|---|---|---|---|---|---|
| | | | - | රූපවාහිනී කැමරා, සංඛිත කැමරා සහ වීඩියෝ කැමරා පටිගතකරණයන්. | |
| | | 8525.80.10 | --- | රූපවාහිනී කැමරා | TS |
| | | 8525.80.90 | --- | සංඛිත කැමරා සහ වීඩියෝ කැමරා පටිගතකරණයන්. | TS |
| | | | | | |
| **356** | **95.06** | | | **සාමාන්‍ය කායික අභ්‍යාස, සරඹ, මලල, අනෙකුත් ක්‍රීඩා, (මේසපන්දු ඇතුළුව) හෝ එළිමහන් ක්‍රීඩා සඳහා මෙම පරිච්ඡේදයේ අන් තැනක නිශ්චිත නො වූ හෝ ඇතුළත් නොවූ භාණ්ඩ සහ ආම්පන්න ; පිහිණුම් තටාකසහ ඔරු පදින තටාක.** | |
| | | | - | ගොල්ෆ් ක්‍රීඩා පිති සහ අනෙකුත් ගොල්ෆ් ක්‍රීඩා ආම්පන්න : | |
| | | 9506.31.00 | -- | ක්‍රීඩා පිති, සම්පූර්ණ | TS |
| | | | - | තන්තු යෙදූ හෝ නොයෙදූ ටෙනිස්, බැට්මින්ටන් හෝ සමානපිති : | |
| | | 9506.51.00 | -- | තන්තු යෙදූ හෝ නොයෙදූ ලෝන් ටෙනිස් පිති | TS |
| | | | - | ගොල්ෆ් බෝල සහ මේස පන්දු බෝල හැර, පන්දු : | |
| | | 9506.61.00 | -- | ලෝන් ටෙනිස් බෝල | TS |
| | | 9506.62.00 | -- | හුළං පිරවිය හැකි | TS |
| | | | - | අනෙකුත්: | |
| | | 9506.91.00 | -- | සාමාන්‍ය කායික අභ්‍යාස, සරඹ හෝ මලල ක්‍රීඩා සඳහා භාණ්ඩ සහ ආම්පන්න | TS |

**4.** 2022 සැප්තැම්බර් මස 09 දිනැති අංක 2296/30 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත්කරන ලද 2022 අංක 14 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි මගින් සංශෝධිත 2020 අගෝස්තු මස 17 දිනැති අංක 2189/4 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත්කරන ලද 2020 අංක 05 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි, මෙමගින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ.

**4.1** සංශෝධිත 2020 අංක 05 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි වල **I වන උපලේඛනයෙන්**, පහත සඳහන් භාණ්ඩ හා ඒවාට අනුරූපී සටහන් මෙයින් ඉවත් කරනු ලැබේ.

| | I තීරුව<br>ශීර්ෂ<br>අංකය | IIතීරුව<br>සංයෝජිත වර්ගීකරණ<br>සංකේතය | | III තීරුව<br>විස්තරය | IV තීරුව<br>ආනයන පාලන<br>බලපත්‍ර<br>(L) |
|---|---|---|---|---|---|
| **37** | **22.02** | | | **සීනි හෝ අනෙකුත් පැණි රසකාරක ද්‍රව්‍යයන් එකතු කරනු ලැබුවා වූ හෝ රස කළා වූ, ඛනිජ ජලය හා වායුව කවන ලද (එරේටඩ්) ජලය ඇතුළු ජල වර්ග හා ශීර්ෂ 20.09 හිසඳහන් පළතුරු හෝ එළවළු යුෂ අඩංගු නොවූඅනෙකුත් අමද්‍යපාන වර්ග.** | |
| | | 2202.99.00 | **-** | අනෙකුත්: | |
| | | 2202.99.30 | **---** | "ශක්ති ජනක පාන" ලෙස අලෙවි වන පාන වර්ග | **L** |

**4.2** ශ්‍රී ලංකා රේගු අධ්‍යක්ෂ ජනරාල් විසින් 2022 සැප්තැම්බර් මස 09 දින සිට 2022 දෙසැම්බර් මස 19 දින දක්වා කාලසීමාව තුළ ශ්‍රී ලංකාවේ ඕනෑම වරායක් / ගුවන්තොටුපළක් වෙත ළඟාවූ, ඉහත රෙගුලාසි 4.1 හි සඳහන් කර ඇති ඕනෑම භාණ්ඩයක් නිදහස් කිරීම,ආනයන හා අපනයන පාලක ජනරාල්ගේ අනුමැතියට යටත්ව සිදුකල යුතු වේ.

5. මෙම රෙගුලාසි ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම උදෙසා ආනයන හා අපනයන පාලක ජනරාල් විසින් ශ්‍රී ලංකා රේගුව සහ බලපත්‍ර ලාභී බැංකු වෙත අවශ්‍ය "මෙහෙයුම් උපදෙස්" නිකුත් කරනු ලැබේ.

EOG 12-0349

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.